**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

**SRI LANKA EXPORT DEVELOPMENT BOARD**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை

EDB SRI LANKA

# යෝජනා කැඳවීම (INVITATION FOR PROPOSAL)

**ශ්‍රී ලංකාවේ සමුද්‍රීය හා අක්වෙරළ සේවා (Marine & Offshore Services - M&OS) අංශය ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීය මහජන සම්බන්ධතා (PR) සේවා ආයතනයක් තෝරා ගැනීම හා සම්බන්ධ කර ගැනීම සඳහා ප්‍රසම්පාදනය**

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**කොන්ත්‍රාත් අංකය : EDB/PU/NCB/2026/02**

01. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු පුමුඛතම රාජ්‍ය ආයතනය වේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සමුද්‍රීය හා අක්වෙරළ සේවා (M&OS) අංශය, විදේශ විනිමය ආදායම් ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදිය හැකි ඉහළ විභවයකින් යුත් අපනයන අංශයක් ලෙස හඳුනාගෙන ඇත.

02. ඒ අනුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපතිවරයා විසින්, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය හා අක්වෙරළ සේවා අංශය ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීය මහජන සම්බන්ධතා සේවා ආයතනයක් තෝරා ගැනීම හා සම්බන්ධ කර ගැනීම සඳහා සුදුසුකම්ලත් හා පළපුරුදු සේවා සපයන ආයතන වලින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

03. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන අනුව ජාතික තරගකාරී ලංසු කැඳවීමේ (NCB) එක් අදියරකින් යුත් ද්විත්ව ලියුම් කවර ක්‍රමවේදය (Single Stage - Two Envelope Procedure) යටතේ ලංසු කැඳවනු ලබන අතර, එම මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන් සඳහා එය විවෘත වේ.

04. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට නම්, ලංසු ඉදිරිපත් කරන දිනට අදාළව කිසිදු රාජ්‍ය ආයතනයක් හෝ පිළිගත් නියාමන අධිකාරියක් විසින් ලංසුකරු අසාධු ලේඛනගත කර, අත්හිටුවා හෝ තහනම් කර නොතිබිය යුතුය. සුදුසුකම්ලත් ලංසුකරුවන් සඳහා අදාළ අවම සුදුසුකම් පහත පරිදි වේ. (වැඩිදුර විස්තර ප්‍රසම්පාදන ලේඛනවල අන්තර්ගත වේ)

**සුදුසුකම් නිර්ණායක**

**a) සාමාන්‍ය පළපුරුද්ද**

- ශ්‍රී ලංකාවේ අදාළ නීති හා රෙගුලාසි අනුව නීත්‍යානුකූලව ලියාපදිංචි කර ඇති සමාගමක් විය යුතුය.
- මහජන සම්බන්ධතා, සන්නිවේදන, ඩිජිටල් අලෙවිකරණය හෝ ඊට අදාළ ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

**b) සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තු පිළිබඳ විශේෂ පළපුරුද්ද**

- පසුගිය වසර පහ (05) තුළ, අපනයන ප්‍රවර්ධනය, ආයෝජන ප්‍රවර්ධනය හෝ සමාන ක්ෂේත්‍රයන්ට අදාළ ජාත්‍යන්තර මහජන සම්බන්ධතා (PR) සහ / හෝ ගෝලීය අලෙවිකරණ වැඩසටහන් අවම වශයෙන් දෙකක් (02) සාර්ථකව සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**c) මූල්‍ය හැකියාව**

- සේවා සපයන්නා (හෝ හවුල් ව්‍යාපාරයක් / සංයුක්ත එකමුතුවක් වන අවස්ථාවක ප්‍රධාන හවුල්කරු) පසුගිය වසර තුන (03) තුළ අවම වශයෙන් රුපියල් මිලියන දහයක (LKR 10 Mn.) වාර්ෂික සාමාන්‍ය පිරිවැටුමක් පවත්වා තිබිය යුතුය.
- මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අවම වශයෙන් රුපියල් මිලියන දෙකක (LKR 2 Mn.) මුදල් ප්‍රවාහ අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රව වත්කම්, ණය පහසුකම් හෝ වෙනත් මූල්‍ය සම්පත් පවතින බව සනාථ කළ යුතුය.

05. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු පහත නිලධාරියාගෙන් කාර්යාල වේලාවන් තුළ ලබාගත හැකිය.

**සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන),**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**6 වන මහල, NDB - EDB Tower,**
**අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**දුරකථන : 011-2300702**
**විද්‍යුත් තැපෑල : disna@edb.gov.lk**

06. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, ආපසු නොගෙවන රුපියල් 1,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් පසු, ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය. එම ලේඛන, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ "Announcements" අංශය යටතේ www.srilankabusiness.com/announcements ද පරිශීලනය කළ හැකිය. ගෙවීම, ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇති ආකාරයට සිදු කළ යුතු අතර, අදාළ ගෙවීම් පත්‍රිකාවේ හෝ මුල් රිසිට්පත යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය ගෙවීම් සනාථ කිරීමේ ලේඛන අමුණා නොමැති යෝජනා ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

07. මුල් ලංසු ලේඛනය කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ **"EDB/PU/NCB/2026/02 – ශ්‍රී ලංකාවේ සමුද්‍රීය හා අක්වෙරළ සේවා අංශය ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීය මහජන සම්බන්ධතා සේවා ආයතනයක් තෝරා ගැනීම හා සම්බන්ධ කර ගැනීම සඳහා ප්‍රසම්පාදනය"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ලංසු ඉදිරිපත් කරන ආයතනයේ නම හා ලිපිනය ද කවරයේ සඳහන් කළ යුතුය. (ලංසු දත්ත පත්‍රිකාව 8.2 බලන්න)

08. ලංසු **2026 ජූලි මස 06 වැනි දින** පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ඉහත ලිපිනය වෙත භාරදිය යුතුය. එම වේලාවෙන් පසු ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු වසා දැමීමෙන් අනතුරුව, එදින පෙ.ව. 11.00 ට, සහභාගි වීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

    සියලුම ලංසු සමග රුපියල් පනස් දහසක (LKR 50,000.00) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් (Bid Security) ඉදිරිපත් කළ යුතුය.

09. පූර්වලංසු රැස්වීම **2026 ජූනි මස 30 වැනි දින** පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 9 වන මහලේ පිහිටි VIP රැස්වීම් කාමරයේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට එම රැස්වීමට සහභාගි විය හැකිය.

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB - EDB Tower,**
**අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**
**2026 ජූනි මස 22 වැනි දින**